**ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය**
කොළඹ
**ප්‍රවෘත්ති නිවේදනය**
මහජන කටයුතු අංශය
දුරකථන: +94 (11) 202-8500 ● ෆැක්ස්: +94 (11) 243-7345
විද්‍යුත් තැපැල: SmyserHM@state.gov ●වෙබ්: http://lk.usembassy.gov

නිවේදන අංක: 20221205

**එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ වී ගොවීන්ට පොහොර මෙට්‍රික් ටොන් 9,300ක් ලබා දෙයි**

**2022 දෙසැම්බර් 5, කොළඹ -** එක්සත් ජනපදය විසින් යාපනය, මුලතිව්, මන්නාරම, වව්නියාව, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ මොනරාගල දිස්ත්‍රික්කවල කුඩා වී ගොවීන් 193,000දෙනෙකුට වැඩි පිරිසක් අතරේ බෙදා හැරීම සඳහා යූරියා පොහොර මෙට්‍රික් ටොන් 9,300 ක් නිල වශයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයට භාර දෙන ලදී. ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) අරමුදල් ඇතිව FAO විසින් ප්‍රසම්පාදනය කරන ලද මෙම පොහොර ප්‍රමාණය, USAID සහයෙන් ශ්‍රී ලංකාවට ලබාදෙන පොහොර ආධාරයේ පළමු තොගය වන අතර, ඉදිරි මාසවලදී අතිරේක සැපයුම් තොග රට පුරා ගොවීන් මිලියනයකට ආසන්න සංඛ්‍යාවක් කරා ළඟා වනු ඇතැයි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

“ඇමරිකානු ජනතාවගෙන් ලැබෙන මේ පොහොර, ඉදිරි මාසවලදී ගණන් කළ නොහැකි තරම් ශ්‍රී ලාංකීය පවුල් වෙත ආහාර සපයන්නට ශ්‍රී ලංකාවේ ගොවීන්ට උදවු කරාවි, ”  යනුවෙන් කොළඹ වරායේ දී එම පොහොර තොගය භාරදීමේ අවස්ථාවට සහභාගි වෙමින් ශ්‍රී ලංකාවේ එ.ජ. තානාපති ජුලී චංග් මහත්මිය සඳහන් කළාය. “ශ්‍රී ලංකාවේ සියළු අවශ්‍යතා මේ පොහොර ආධාරයෙන් සපුරාලන්නේ නැති බව මා දන්නවා, නමුත් මේ ආධාරය මේ අභියෝගාත්මක අවස්ථාවේ ශ්‍රී ලංකාවේ ජනතාව සහ රජය වෙත සහය දැක්වීමට එක්සත් ජනපදයෙන් සිදුකරන වඩාත් පුළුල් ආයෝජනයක එක් පැතිකඩක් පමණයි. සමස්ථයක් වශයෙන් ගත වූ වර්ෂය තුළ අපි නව ආධාර වශයෙන් හා කුඩා ව්‍යාපාර සඳහා ණය වශයෙන් ඩොලර් මිලියන 240 ඉක්මවන ප්‍රමාණයක් නිවේදනය කර ඇති අතර, දිගින් දිගටම අපි එවැනි කටයුතු සිදුකරනවා. අද ලබාදුන් පොහොර ආධාරය වැනි උපකාර හරහා පිළිබිඹු වන්නේ ශ්‍රී ලංකීය ජනතාව කෙරෙහි ඇමෙරිකාවේ ඇති හොඳහිත සහ සැබෑ කැපවීමයි.”

“ශ්‍රී ලාංකීය වී ගොවීන්ට රටට ආහාර සපයන්න හොඳින් ම හැකියාව තිබෙනවා, ඔවුන්ට තමන්ගේ ජීවනෝපාය කරගෙන යෑම සඳහා සහ රටේ ආහාර සුරක්ෂිතතාවය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය කරන යෙදවුම් ලැබෙන බව සහතික කරගන්නට අපි වැඩ කරනවා. අවදානමේ සිටින ගොවීන්ට අත්‍යාවශ්‍ය කර තිබෙන පොහොර නොමිලයේ ම ලැබෙන බව සහතික කරගන්නට ඔවුන් ලබාදුන් මේ සහය වෙනුවෙන් අපි එක්සත් ජනපද රජයට සහ FAO සංවිධානයට ස්තුති කරනවා,” යනුවෙන් කෘෂිකර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද අමරවීර මහතා සඳහන් කළේය.

වී නිෂ්පාදනය වැඩි කිරීමට සහ ආහාර අර්බුදයක් උද්ගත වීම වළක්වා ගැනීමට අත්‍යවශ්‍ය පොහොර ලබා ගැනීමට, USAID හරහා එක්සත් ජනපදය ඩොලර් මිලියන 46 ක මුදලක් ලබා දී ඇත - අද දින භාර දෙනු ලැබුවේ ඉන් කොටසක් වේ. පසුගිය කෘෂිකාර්මික කන්න දෙක තුළ අඩු අස්වැන්න ලැබීම හේතුවෙන් සහ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් පීඩාවට පත් වූ කුඩා පරිමාණ ගොවීන්ට මෙම අරමුදල් මගින් මුදල් ආධාර ලබා දෙනු ඇත. ආධාර එහි අපේක්ෂිත ප්‍රතිග්‍රාහකයන් වෙත ළඟා වන බවත් අවදානමට ලක්විය හැකි ගොවි පවුල්වලට ප්‍රතිලාභ සැලසෙන බවත් සහතික කරගැනීම සඳහා USAID සහ එහි හවුල්කරුවන්ගේ කාර්යය අධීක්ෂණය කිරීමට සහ ඇගයීමට යාන්ත්‍රණ ස්ථාපිත කර තිබේ.

"ඔවුන්ගේ ඵලදාව සහ අස්වැන්න වැඩි කරගැනීම සඳහා පැල සිටුවන කාලයේදී දැඩිව අවශ්‍ය කරන පොහොර කුඩා පරිමාණ වී ගොවීන් වෙත ලඟාවන බව සහතික කරන්නට අප වූ පොරොන්දුව අප විසින් ඉටු කරමින් සිටිනවා. මේ සංකීර්ණ හදිසි අවස්ථාවේ ශ්‍රී ලාංකිකයින් සෞඛ්‍ය සම්පන්න සහ ඵලදායී ජීවිත ගතකරන බව සහතික කරගන්නට ඔවුන් වෙත අප ලබාදෙන සහයේ එක් කොටසක් වනවා," යනුවෙන් දැනට ශ්‍රී ලංකාවේ චාරිකාවක නිරත වෙමින් සිටි USAID ආසියා කාර්යාංශයේ නියෝජ්‍ය සහකාර පරිපාලකවරිය වන අන්ජලී කවුර් මහත්මිය සඳහන් කළාය.

"FAO සංවිධානය වශයෙන් අප ජීවනෝපාය බේරා ගැනීම ජීවිත බේරාගැනීමට හේතු වන බව විශ්වාස කරනවා. USAID හරහා ප්‍රසම්පාදනය කරගත් මෙම යූරියා පොහොර ටොන් 9,300 කුඩා පරිමාණ ගොවීන් ඵලදායී කෘෂි පරිච අනුගමනය කරන බවත් රට මුහුණ දී සිටින මේ ඉතාමත් දුෂ්කර කාලයේ ඔවුන්ගේ ආහාර සහ පෝෂණ අවශ්‍යතා සපුරාගන්නට ඔවුන්ට හැකිවන බවත් සහතික කරනවා. මේ කාර්යය සඳහා දැක්වූ සහය වෙනුවෙන් අපි එක්සත් ජනපද රජයට ස්තුතිවන්ත වන අතර, ශ්‍රී ලාංකීය කෘෂිකර්මාන්තය ඉදිරියට ගෙනයාම සඳහා USAID සමගින් එක්ව වැඩ කරන්නට අපි බලාපොරොත්තුවෙන් සිටිනවා," යනුවෙන් FAO සංවිධානයේ ශ්‍රී ලංකා අධ්‍යක්ෂ විමලේන්ද්‍ර ශරන් මහතා සඳහන් කළේය.

අද පැවති භාරදීමේ උත්සවයට ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති ජූලී චන්ග් මහත්මිය; ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතා; USAID හි ආසියාව සඳහා නියෝජ්‍ය සහකාර පරිපාලකවරිය වන අන්ජලී කවුර් මහත්මිය ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා FAO නියෝජිත විමලේන්ද්‍ර ශරන් මහතා; සහ ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා USAID දූත මණ්ඩල අධ්‍යක්ෂ ගේබ්‍රියෙක් ග්‍රෞ මහතා සහභාගී වූහ.

\# # #

**USAID පිළිබඳව**

1956 සිට එක්සත් ජනපද රජය සෞඛ්‍ය සම්පන්න, උගත් සහ සේවා නියුක්ත ජනගහනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට සංවර්ධන සහ මානුෂීය ආධාර ලබා දී ඇත. ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) ශ්‍රී ලංකාව සමඟ එක්ව තිරසාර සහ සර්වග්‍රාහී ආර්ථික වර්ධනයක් පෝෂණය කිරීම, සර්වග්‍රාහීත්වය ප්‍රවර්ධනය කිරීම, පාලනය ශක්තිමත් කිරීම සහ නිදහස් හා සමෘද්ධිමත් ඉන්දු-ශාන්තිකර කලාපයක් ගොඩනැගීමට කටයුතු කරයි. USAID ස්වභාවික විපත් සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් වැඩි දියුණු කිරීම, පාරිසරික සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සහ බලශක්ති සුරක්ෂිතභාවය සහ තිරසාරභාවය වැඩිදියුණු කිරීම සඳහා ද කටයුතු කරයි. ශ්‍රී ලංකාවේ USAID හි වැඩ කටයුතු පිළිබඳ වැඩිදුර දැන ගැනීමට කරුණාකර https://www.usaid.gov/sri-lanka සබැඳිය වෙත පිවිසෙන්න.

**FAO පිළිබඳව**

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) කුසගින්න පරාජය කිරීමේ ජාත්‍යන්තර ප්‍රයත්නයන්ට නායකත්වය දෙයි. කෘෂිකාර්මික, වන වගා සහ ධීවර භාවිතයන් නවීකරණය කිරීමට සහ ශක්තිමත් කිරීමට, ඒවා වඩාත් තිරසාර කිරීමට සහ සැමට ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීමට එම සංවිධානය රටවල්වලට උපකාර කරයි. ලෝකයේ දුප්පතුන් සහ කුසගින්නෙන් පෙළෙන බහුතරයක් වෙසෙන ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීම කෙරෙහි FAO විශේෂ අවධානය යොමු කරයි. වැඩි විස්තර සඳහා පිවිසෙන්න: www.fao.org.